# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,923/6 — 1970 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා — 1970.9.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 296/5**

කෘ. ඉ./ඇ. අංක ජේ. 258 (බීආර්).

අ. ආ. කා. අංක එල්. 91.

1964 රේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත, (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 19 වැනි වගන්තියේ (1) හා (2) වැනි උප වගන්තිවල විධිවිධාන යටතේ කෘෂිකර්ම හා ඉඩම් ගරු ඇමතිතුමාගේ උපදෙස් පිට, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, රාජනීතිඥ ටී. ඇස්. ප්‍රනාන්දු මහතා, සී.බී.ඊ., සහ එම්. රෆීක් මහතා 1970 ඔක්තෝබර 1 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා, එහි සඳහන් වන පරිදි අභියාචනා විසඳීම පිණිස වූ සමාලෝචන මණ්ඩලයේ නිතිඥ සාමාජිකයින් වශයෙන් පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

තවද, එකී පනතේ 19(3) වැනි වගන්තියේ විධිවිධාන යටතේ උතුමාණන් වහන්සේ විසින්, රාජනීතිඥ ටී. එස්. ප්‍රනාන්දු මහතා, සී.බී.ඊ., 1970 ඔක්තෝබර 1 වැනි දින සිට, එම මණ්ඩලයේ සභාපති වශයෙන් ද පත් කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් 17 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

9–1012


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

686/15——රේ 16908—10,775 (70/9)